# හෙළ දරුවන්ගේ දස්කම් විදහා පෑ හෙළ දරු වරුණ







පසුගිය මාසයේ ලන්ඩනයේ හවුන්ස්ලෝ හි ලැම්ප්ටන් පාසැල් ශාලාවේ වේදිකාගාරයේ මින් පෙර අප නුදුටු අමුතු සහ අළුත් ප්‍රසංගයක් වීය. එය නම්කර තිබුණේ හෙළදරු වරුණ යනුවෙනි. එම ප්‍රසංගය සිංහළ බස කතාකරන එංගලන්තයේ හැදෙන වැඩෙන ලාංකික දරුවන්ගේ කුසලතා ඉදිරියට ගෙනෙන්නට ගන්නා ප්‍රයත්නයක් බව එහි ප්‍රචාරක පත්‍රිකාවල සංවිධායකවරු සඳහන් කර තිබිණ. නිතර දක්නට ලැබෙන තවත් එක ශ්‍රීලාංකික ප්‍රසංගයක් බලන්නට යන සිතුවිල්ලෙන් මිස එය මින්පෙර නුදුටු ප්‍රසංගයක් වේයයි බොහෝ දෙන නොසිතන්නට ඇත. මෙහි විශේෂත්වයක් වීය. සැබැවින්ම එය වෙනස් අන්දමක ප්‍රසංගයකි. එය තනිකරම දරුවන් විසින් ඉදිරිපත් කරන ලද, දරුවන් විසින්ම ගී ගායනා කරන ලද, දරුවන් විසින් නැටුම් හා ගැයුම් ඉදිරිපත් කරන ලද, එපමණක්ද නොව දරුවන් එහි කථනයේ යෙදෙමින් ප්‍රසංගය අවසානය දක්වාම මෙහෙයවීමද ඉතා විශිෂ්ට අන්දමින් කළ බවත්, ඔවුන් කිසිදු සබකෝලයක් නැතිව වේදිකාවේ පළපුරුදු අය මෙන් රඟුම් දැක්වූ බවත් ඔවුන්ට ප්‍රශංසාවක් ලෙස මෙහි ලියා තබමි.

සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂා වෙන්ම කටයුතු කරන, ඉංග්‍රීසි බස එම මනා උච්චාරණයෙන් යුතුව තෙපලන සියයට අනූවක්ම එංගලන්තයේ සිටින සිංහළ දරුවන් එදා එතැනදී හොඳ හරබර සිංහළ යොදා කතා කරමින්, එකද ඉංග්‍රිසි වචනයක් මිශ්‍ර නොකරන්නට වගබලාගත් හැටි පුදුමය.

ප්‍රසංගයට ඇතුළත් කර තිබුණු සියළුම අංග සිංහල සංස්කෘතික ආරට අනුව සකස් කළ ඒවා විය. වන්නම්, ජන කවි, ගැමි නැටුම්, වන්නම්, ජන කවි, ගැමි නැටුම්,සිංහළ නාට්‍ය යන්හි ජවනිකා ආදී මේ සියල්ල එහි වූ ප්‍රේක්ෂක පිරිසට අභිමානය සිතට දැන වූ බව නිසැකය.

මෙවැනි ප්‍රසංගයකට අතගසන්නට කෙනෙකුට හිතෙන්නේ ඔහු සැබැවින්ම තම සංස්කෘතිය තුළ හැදී වැඩී එහි අගය වටහාගත් කෙනෙකුවීම හේතු කොට ගෙනය. එසේම මෙවැන්නක් සඳහා කුඩා දරුවන් පුහුණු කිරීමද ලෙහෙසි නැත. සංවිධායකවරුන්ගේ අප්‍රතිහත ධෛර්‍යය නිසාම මෙවැනි ප්‍රසංගයක් ලන්ඩනය වැනි නගරයක වේදිකාගත කරන්නට හැකිවිය. මෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කළ තරුණ කලාකරුවෙකු වන ආසිරි බණ්ඩාර ඇතුළු සංවිධායක මඩුල්ලට සිංහළ සංස්කෘතිය අගයන කාගේත් තුති පැසසුම් හිමිවිය යුතුය. එසේම මෙම ප්‍රසංගයේ කොටස්කරුවන් වූ සියළු දරු දැරියන් තුළ මේ මගින් තම මව් රටටද, හෙළ සංස්කෘතියටද ඇල්මක් ආදරයක් නොනිමී දැල්වේවායි ප්‍රාර්ථනා කරමු.

♦ වෙනුර

# කලයාණ මිත්‍ර ලක්ෂණ පිළිබඳවයි මේ

මිතුරුතුමෝ දුක සැප දෙකෙහිම පැවතී
බිතු සිතුවම් රූ මෙන් පිටු නොපාවිතී

තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියෝ කල්‍යාණ මිත්‍රයාගේ ලක්ෂණ පිළිබඳව එසේ ප්‍රකාශ කළහ. දුකෙහිදීත් සැපෙහිදීත් අප අත්හැර නොයා අප සමගම රැඳෙන කල්‍යාණ මිතුරෝ මේ ජීවිත කාලය තුළ වරින් වර මුණගැසෙත්. එවන් මිතුරන්ගේ ඇසුර ජීවිතයට ඉමහත් ආශීර්වාදයක් ද ශක්තියක් ද වේ.

මෑත යුගයේ බිහිවූ දාර්ශනිකයන් බොහෝ දෙනෙක්ද මිත්‍රත්වය පිළිබඳව අදහස් දක්වා ඇත. සත්‍යවූ මිත්‍රත්වය ගැන කතාකරමින් පෙඩ්රික් නීට්ෂේ නම් දාර්ශනිකයා විසින් කරන ලද ප්‍රකාශය අපේ විශේෂ අවධානයට ලක්විය යුත්තකි.

මිත්‍රයින් නිතරම එකිනෙකාට පාඩම් වන පරිද්දෙන් ක්‍රියාකළ යුතුය. එකිනෙකා විවේචනය කළ යුතුය. එකිනෙකා හරි ගස්සා ගැනීමට, ඔවුනොවුන් වැරදි වලින් මුදවා ගැනීමට උත්සාහ කළ යුතුය. මේ නිසා මිත්‍ර ධර්මයේදී ආවේගික කරුණු වලට කිසිසේත්ම තැනක් නොදිය යුතුය.,

සංස්කෘත උපදේශ සාහිත්‍යය පිළිබඳව කතාකිරීමේදී හිතෝපදේශය අමතක කළ නොහේ. එහි බොහෝ තැන්වල කල්‍යාණ මිත්‍රයාගේ ලක්ෂණ මොනවාද යන්න පිළිබඳව අදහස් දැක්වේ. මිත්‍ර යනු සංස්කෘත භාෂාවට අයත් වචනයකි. එයට උතුම් තේරුමක් ඇත. සැබැවින්ම මිත්‍ර යනු මෛත්‍රියෙන් යුක්ත යන්නයි. මෛත්‍රිය ඇති තැන ආත්මාර්ථයට ඉඩක් නැත. එහෙයින් මිත්‍රයා තුළ නිබඳ පැවතිය යුත්තේ දයාර්ද චිත්තයකි.

මිත්‍ර යන වචනය හැරුණු විට මේ දයාන්විත හදවතින් යුතු තැනැත්තා හැඳින්වීම සඳහා සංස්කෘත භාෂාව තුළ තවත් එබඳුදු වචන රාශියක් ඇත. සුහාත්, සඛා, බන්ධූ, වයස්‍ය, ප්‍රියකෘත්, පුණයි සහ ස්නේහී ඉන් කීපයකි. මේ සෑම වචනයකින්ම සුහද බව, මිතුරුබව, ඥාතීත්වය, සිනිඳුබව, ප්‍රියවූවක්ම කරනබව, ආදරණීය බව යන හැඟීම් ප්‍රකට කරන්නේ වෙයි.

මෙබඳු වූ ගුණාංගයන්ගෙන් සමූපේත වූ මිතුරන්ගේ ආශ්‍රය ලබන තැනැත්තා භාග්‍යවන්තයෙකු වෙයි. මිතුරෙකු සමග කතාකිරීම, මිතුරෙකු හා කෙරෙන පිළිසඳර යන සියල්ල ලබන තැනැත් තාට වඩා පුණ්‍යවන්තයෙකු මෙලොව නැතැයි හිතොපදේශ රචකයා පවසයි.

සිත ශෝකයෙන් වෙළී පවත්නා විටකදී ඒ දුකේදී එක්ව ඉන් මුදවා ගැන්ම මිත්‍ර ලක්ෂණයකි. දෙවැන්න, මිතුරා, ඇසුරු කරන්නා තුළ සතුට ඇතිකරන්නේ වෙයි. ඔහු නිබඳ ගෙන එන්නේ සිත් තැවුල නොව ප්‍රීතියයි. එසේම කල්‍යාණ මිත්‍රයා පිළිබඳව අපට සෑම විටම විශ්වාසය තැබිය හැකිය. මන්ද ඔහුගේ ක්‍රියා තුළ අවංකභාවය රැඳී පවත්නා බැවිනි.

නැති තැන කටයුතු නසන, ඉදිරියේදී පමණක් හොඳ කියන මිතුරන්ගෙන් ඵලක් නැති අතර එබඳු මිතුරන් විෂ පිරුණු කිරි කළයක් සේ සලකා අත්හළ යුතු ය.

පිරිසිදුබව, ත්‍යාගිශීලීබව, ශූරත්වය, සැපෙහිදී මෙන්ම දුකෙහිදීද සම පැවැත්ම, එකඟ බව ඇල්ම හා සත්‍යවාදීබව සහෘද් ගුණ හෙවත් කල්‍යාණ මිත්‍ර ලක්ෂණ වෙයි.

මිත්‍රත්වය යනු හේතු මත පදනම් වන්නක් නොවේ. මොහු මට උදව් කළ නිසා මා මිතුරු විය යුතුය. මොහුගෙන් මට ඉදිරියේදී උදව් ලබාගත හැකිය. ආදී වශයෙන් සිතා හේතු මත ඇතිකරගන්නා සම්බන්ධතාව මිත්‍රත්වය යනුවෙන් හැඳින්විය නොහේ. මිත්‍රත්වය වනාහි අතිශයින්ම ගැඹුරු වූවකි. කිසිදු හේතුවලින් තොරව පියවි ස්වභාවයෙන්ම මිත්‍රශීලී ගුණයෙන් යුක්ත වන තැනැත්තා විපතේදී සිය හිතවතා අත් නොහරියි. මෙබඳු මිතුරෙකු ලැබෙන්නේ භාග්‍යය නිසාමය.

සමහර මිත්‍රයෝ සිය පෞද්ගලික උවමනාවන් ඉටුකර ගැන්මේ අදහසින් සමෘධිමත් ජීවිත ගතකරන මිතුරන් සොයා යති. එහෙත් ඒ අයම සිය මිතුරන් විපතට පත්වූ කල්හි අත්හරිති. එහෙයින් විපත් වනාහි මිත්‍රත්වය පිළිබඳව විමසීමේ උරගලයි.

සංකීර්ණ වූ සමාජයක දිවයිනෙන් සැතපුම් දහස් ගණනක් ඈත රටවල් වල ජීවත්වන අප තුළ හෝ අපට මුණගැසෙන අය තුල හෝ මේ සියළු මිත්‍ර ලක්ෂණ පිහිටුවා නොතිබෙනවා විය හැක. මෙහි කියවෙන ඇතැම් ගුණාංග අප තුළ ඇති බව දැනගැන්ම මෙන්ම සමහර ගුණ නැතිබව දැනගැන්ම ද එකසේ වැදගත් ය. මේ අවබෝධයම කෙනෙකු තුළ කල්‍යාණ මිත්‍රත්වය පිහිටීමේ මුල් පදනම විය හැක.

♦ ආරියසේන බ්‍රාහ්මණගේ
Stockholm Sweden

# දිවි සිනමාවෙන් සමුගත් අසෝක පීරිස්



සිනමාවේ හා රූපවාහිනියේ විවිධ චරිතයන්ට පණ කැවූ දක්ෂ චරිතාංග නළුවෙකු ලෙස ප්‍රේක්ෂක සම්මානයට පාත්‍රව සිටි අසෝක පීරිස් දෙසැම්බර් මස කොළඹ දී හදිසි හෘදයාබාධ යකින් මියගියේ ය.

ගැඹුරු කටහඬක්ද ඔහුටම ආවේණිකවූ රංග ශෛලියක් අසෝ කට තිබුණි. මියයන විට ඔහුගේ වයස අවුරුදු 65 කි. ගල් කිස්සේ ශාන්ත තෝමස් විදුහලේ ආදි ශිෂ්‍යයෙකුවූ ඔහු මුලින් ම රංගනයට පිවිසියේ 1965 දී පලාමල්ල නම් නාට්‍යයේ රඟ පාමිණි. ලූෂන්ද සොයිසාගේ ඉංග්‍රීසි නාට්‍යවල රඟපෑ ඔහ ුට ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ දෙලොවක් අතර චරිතයක් ලැබිණ.

ලූෂන් ද සොයිසාගේ ඉංග්‍රීසි නාට්‍යවල රඟපෑ ඔහුට ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ දෙලොවක් අතර චරිතයක් ලැබිණ.

අසෝක පීරිස්ට ප්‍රධාන චරිතයක් රඟපාන්නට ලැබුණු මුල්ම චිත්‍රපටය රෝයි ද සිල්වා අධ්‍යක්ෂණය කළ තණගිරවි ය. බොහෝ අධ්‍යක්ෂකවරු ඔහුගේ දක්ෂතා හඳුනා ගත්හ. ලෙස්ටර් ගේ යුගාන්තය, බැද්දේගම, සුමිත්‍රා පීරිස්ගේ යහළු යෙහෙළි, සත්‍යග්‍රහණය, විරාගය ආදී චිත්‍රපට රැසකට අසෝක රංගනයෙන් දායක විය. ඔහු ටෙලි නාට්‍ය රැසකම රඟපා ඇත. තමන්ගේ පාඩුවේ ජීවත්වූ අසෝක පීරිස් ගැන වරදක් කියන කිසිවෙකු සිනමා ක්ෂෙත්‍රයේ නැත. ඔහු හිතමිතුරන්ට ඇළුම් කළ හිතවතෙකි. ඔහු වැනි දක්ෂතා ඇති අයගේ වියෝගය සැබැවින්ම දුකක් මෙන්ම පාඩුවක්ද වෙයි.

- තිලක් රූපසිරි



# දේශප්‍රේමයට මිළක් ඇත

අද අප ජීවත්වන්නේ ඉතා භයානක අවිනිශ්චිත ලෝකයකය. අද ප්‍රවේසම් සහිතයයි තැනක් මිහිපිට කොහේවත් නැතුවා සේය. හොරු මංකොල්ලකරුවෝ අපරාධකාරයෝ වාගේම හොඳ පුරවැසියෝද නීතිගරුක අයද රාජ්‍ය නායකයෝද බිහිසුණු ලෙස මියයති. අද ත්‍රස්තවාදය නැති රටක් ලොව නැති තරම්ය.

දැනට මාස දෙකකට පමණ රූපවාහිනියේ බෙනාසීර් භූතෝ දුටිමි. ඇය ඉතා නිදහස්ව කිසිදු කලබලයක් නැතිව ඉදිරියේ පකිස්ථානයට ගොස් තම පක්ෂය මෙහෙයවා යළිත් ප්‍රජාතන්ත්‍රවාදය පණගන්වා ජනතාවට සේවය කරන බවක් කීවාය. ඒ දේවල් කළත් නොකලත් ඒ එදා ඇය කිව් දේවල්ය. එහෙත් සති දෙකකට පෙර බෙනාසීර් තම රටේදී මැරුම් කෑවාය. ඇය තම රටට නොගොස් සිටියා නම් මිය නොයන්නට තිබිණ. එහෙත් අප බොහෝ දෙනෙකුට මෙන්ම ඇයටද පිටරටක ජීවත්වීම ජීවිතයක් නොවේ. කොතරම් දේ තිබුණත් තමාගේ රට මෙන් වෙනත් රටක් හිතට නොගැලපේ. දේශප්‍රේමී වීම හොඳ දෙයක් ලෙසට පිළිගැනෙතත් එය බෙනාසීර්ට පිටුපෑවේ ය.

♦ දයා ආනන්ද